ලංසුපත් අංකය : ...............                                    ලදුපත් අංකය : ......................

නිකුත් කරන ලද්දේ
...................................
...................................                    ...........................................................

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ (ස්වදේශ කටයුතු අංශය) ලේකම් වෙනුවට

**<u>රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය</u>**

**<u>සුඛෝපභෝගී වාහන සහ භාවිතයෙන් ඉවත්කර ඇති වාහන</u>**

**<u>විකිණීම සම්බන්ධයෙන් වූ කොන්දේසි</u>**

CONFIDENTIAL

## 01. <u>පොදු කරුණු</u>

1.1 වාහන මිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන පාර්ශවයන් (ගැණුම්කරුවන්) විසින් පහත ලේඛන ඇතුලත්ව තම ලංසුව මුල් පිටපත හා දෙවන පිටපත ලෙස කවර දෙකක බහා මුද්‍රා තබා “රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය(ස්වදේශ කටයුතු අංශය), 16 වන මහල, "නිල මැදුර" , ඇල්විටිගල මාවත, කොළඹ 05” යන ලිපිනයට 2025.09.16 දින පෙ.ව. 10.00 හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් එම ලිපිනයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම මගින් ලංසු ඉදිරිපත් කල යුතු වේ.

ලංසුවේ ඇතුලත් විය යුතු ලේඛන

- ලංසු පත්‍රිකාව
- ආපසු ගෙවනු ලබන ලංසු සුරක්ෂණ මුදල ගෙවූ රිසිට්පතේ ඡායා පිටපත
- අත්සන් කරන ලද කොන්දේසි පත්‍රිකාව
- දූෂ්‍යසන්ධානීය නොවන බවට වන දිවුරුම් ප්‍රකාශය

1.2 ලංසු ලේඛන ඉදිරිපත් කිරීමේදී, පහත 1.3 ඡේදයේ දක්වා ඇති ආපසු නොගෙවන ලංසු තැන්පත් මුදල රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය වෙත ගෙවීමෙන් අනතුරුව මිලදී ගනු ලබන ලංසු ලේඛන පමණක් භාවිතා කර මිල ගණන් ඉදිරිපත් කල යුතුය.

1.3 මිල ගණන් ඉදිරිපත් කරනු ලබන එක් එක් වාහනය සඳහා පහත වගුවෙහි සඳහන් **ආපසු ගෙවනු ලබන තැන්පතුවක්** ද මුදලින් ගෙවිය යුතුය. කිසියම් ලංසුරුවකු ආපසු ගෙවන තැන්පත් මුදල නොමැතිව වාහන සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇත්නම් එම ලංසු පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| ලොට් අංකය | වාහන අංකය | වාහන මාදිලිය හා වර්ගය | නිෂ්පාදිත වර්ෂය | ආපසු ගෙවනු නොලබන ලංසු තැන්පතුව (රු.) | ආපසු ගෙවන තැන්පතුව (රු.) |
|---|---|---|---|---|---|
| | CAT 8228 | Audi - A8 3.0L | 2016 | 5,000.00 | 50,000.00 |
| | KV 0618 | Toyata - Land Cruiser | 2012 | 5,000.00 | 50,000.00 |
| | KP 0914 | Toyata - Land Cruiser | 2011 | 5,000.00 | 50,000.00 |
| | KQ 2196 | Toyata - Land Cruiser | 2011 | 5,000.00 | 50,000.00 |
| | KS 5534 | BMW - 5201 | 2011 | 5,000.00 | 50,000.00 |
| | KQ 7809 | Nissan-Teana | 2011 | 5,000.00 | 50,000.00 |
| | GP 3121 | Toyata - Land Cruiser | 2002 | 5,000.00 | 50,000.00 |
| | GD 7246 | Nissan - Petrol | 2000 | 5,000.00 | 50,000.00 |
| | 301-1410 | Toyata - EL0R AEMDS | 1999 | 5,000.00 | 50,000.00 |
| | KK 5267 | Nissan - X - Trail | 2011 | 5,000.00 | 50,000.00 |
| | KU -7910 | Toyata - Land Cruiser | 2012 | 5,000.00 | 50,000.00 |
| 01 | | Mahindra – Bolero 4wd | 2006 | 3,000.00 | 5,000.00 |

1.4 මිල ගණන් කැඳවීමේ සිට මිල ගණන් විවෘත කරන තෙක් හේතු ඉදිරිපත් කිරීමකින් තොරව ඉහත 1.3 ඡේදයේ සඳහන් එක් වාහනයක්, වාහන කිහිපයක් හෝ වාහන සියල්ල හෝ ලංසුවෙන් ඉවත් කිරීමේ බලය රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ (ස්වදේශ කටයුතු අංශය) ලේකම් සතුය. ලංසු විවෘත කර අදාළ ප්‍රදානයන් ලබාදීම තෙක් හේතු ඉදිරිපත් කිරීමකින් තොරව, ඕනෑම ලංසුවක්, කිහිපයක් හෝ සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රසම්පාදන කමිටුව සතුය.

1.5 ලංසු ලේඛන සිංහල හෝ ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් තෝරාගත් භාෂාවකින් මිලදී ගෙන ඉදිරිපත් කළ හැකිය. (සිංහල හා ඉංග්‍රීසි භාෂා අතර අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂාවෙන් සකස් කරන ලද ලංසු ලේඛනය පිළිගනු ලැබේ.)

1.6 එක් ලංසු ලේඛන කට්ටලයක් මගින් එක් වාහනයක් වෙනුවෙන් පමණක් මිල ගණන් ඉදිරිපත් කල යුතු අතර වාහන වැඩි සංඛ්‍යාවකට මිල ගණන් ඉදිරිපත් කරන්නේ නම් වෙනම ලංසු ලේඛණ කට්ටල මිලදී ගත යුතුය.(වාහන වර්ගය හා වාහන ලියාපදිංචි අංක අනුව මිල ගණන් වෙන වෙනම ඉදිරිපත් කිරීම සඳහා)

1.7 අයුතු බලපෑම් කිරීම, දූස්සන්ධානය හෝ වෙනත් වංචනික ක්‍රියාවක යෙදීම, මෙම ලංසුව සඳහා ප්‍රදානයන් ලැබීමට නුසුදුසුකමක් වේ.

1.8 මිල ගණන් ඉදිරිපත් කිරීමේ ලේඛනයේ නම සඳහන් පුද්ගලයාගේ නමින්ම ලංසු තැන්පතු (ආපසු ගෙවන හා ආපසු නොගෙවන) ගෙවීම සිදුකල යුතුය. සාර්ථක ලංසුකරුට වාහනයේ අයිතිය පැවරීමේ බලය ලබාදීමේ ලිපිය නිකුත් කරනු ලබන්නේ ඔහු/ඇය විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් ඉදිරිපත් කිරීමේ ලේඛනයේ සඳහන් නමටය.

1.9 වාහනයේ අයිතිය පැවරීමේදී අදාළ වන සියළු ගාස්තු ගැනුම්කරු විසින් දැරිය යුතු වේ.

## 02 <u>සුඛෝපභෝගී වාහන සහ භාවිතයෙන් ඉවත්කර ඇති වාහන පරීක්ෂා කර බැලීම හා ලංසුපත් නිකුත් කිරීම</u>

2.1 මිල ගණන් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයන්ට පුවත්පත් දැන්වීම් දින සිට 2025.09.15 දින දක්වා **කොළඹ 05, ඇල්විටිගල මාවත, "නිල මැදුර", "රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය(ස්වදේශ කටයුතු අංශය), බිම් මහලේදී** සතියේ වැඩ කරන දිනවලදී පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා අදාල වාහන පරීක්ෂාකර බැලිය හැකි අතර ආපසු නොගෙවනු ලබන වාහන විකිණීමේ දැන්වීමේ සඳහන් ගාස්තු 16 වන මහලේ පිහිටි සරප් අංශය වෙත 2.1 හි සඳහන් වේලාවන් තුලදී ගෙවා ලංසු ලේඛණ කට්ටල ලබාගත හැකිය.

## 03 <u>ලංසු මිල ගණන් ඉදිරිපත් කිරීම</u>

3.1 මිලදී ගැනීමට අපේක්ෂා කරන එක් එක් වාහනය සඳහා වෙන් වෙන් වශයෙන් ලංසු පත්‍ර ඉදිරිපත් කල යුතුය.

3.2 මුද්‍රා තබන ලද ලංසු පත්‍රිකා **2025.09.16** වන දින පෙ.ව **10.00** ට පෙර ලැබෙන සේ මුල් පිටපත හා අනු පිටපත වශයෙන් පිටපත් දෙකකින් සකස් කර වෙන් වෙන් වශයෙන් කවර දෙකක බහා නැවත එම කවර දෙක එක් කවරයකට දමා **"ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය(ස්වදේශ කටයුතු අංශය), 16 වන මහල, "නිල මැදුර" , ඇල්විටිගල මාවත, කොළඹ 05"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මුද්‍රා තබන ලද ලංසු පත් අතින් ගෙනැවිත් කොළඹ 05, ඇල්විටිගල මාවත, "නිල මැදුර", රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය(ස්වදේශ කටයුතු අංශය), 16 වන මහල හි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

3.3 ලංසු ආකෘති පත්‍ර ඇතුළත් කර එවනු ලබන කවරයෙහි වම් පස ඉහල කෙලවරේ **"වාහන විකිණීම සඳහා වූ ලංසුලේඛණ - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය (ස්වදේශ කටයුතු අංශය), "නිල මැදුර" "** යනුවෙන් සහ **"වාහන අංකය හෝ ලොට් අංකය"** සඳහන් කල යුතුය.

3.4 ඉදිරිපත් කරනු ලබන ලංසුවෙහි යම් කිසි වෙනසක් කරන්නේ නම් ලංසුකරුගේ කෙටි අත්සන එම ස්ථාන වල යෙදිය යුතුය. ඉලක්කමෙන් සඳහන් කර ඇති මිල ගණන්, අකුරින් සඳහන් කර ඇති මිල ගණනට අසමාන නම් අකුරින් සඳහන් මිල ගණන් පිළිගනු ලැබේ.

CONFIDENTIAL

## 04 ටෙන්ඩර් භාරගැනීම අවසන් කිරීමේ හා විවෘත කිරීමේ දින

4.1 2025.09.16 වන **දින පෙ.ව 10.00** ට ටෙන්ඩර් භාරගැනීම අවසන් වී පෙ.ව. 10.00 ට 19 වන මහලේදී ලංසුපත්‍ර විවෘත කරනු ලැබේ.

4.2. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරු හෝ ඔහුගේ / ඇයගේ බලය පැවරීමේ ලිපිය සහිත බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකි අතර, පැමිණෙන්නන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත රැගෙන පැමිණීම අනිවාර්යය වේ.

## 05 සාර්ථක ලංසුකරු තෝරා ගැනීම

5.1 ලංසු ලේඛන වලට අමුණා ඇති මිල ලේඛනයේ ලංසු අගය ඉලක්කමෙන් සහ අකුරින් දැක්විය යුතු අතර, ඉලක්කමෙන් සහ අකුරින් සඳහන් වටිනාකම් දෙක අතර වෙනසක් පවතින අවස්ථාවක, අකුරින් සඳහන් ලංසු වටිනාකම බලාත්මක වේ.

5.2 විකිණීම සඳහා ඉදිරිපත්කර ඇති සුබෝපභෝගී වාහන සහ භාවිතයෙන් ඉවත්කර ඇති වාහන සඳහා ලංසු කොන්දේසි සපුරා ඇති ලංසුකරුවන් අතරින් ඉහළම වටිනාකම ඉදිරිපත්කර ඇති ලංසුකරු අදාළ වාහන විකිණීම සඳහා තෝරාගනු ලබයි.

5.3 එක් එක් සුබෝපභෝගී වාහන සහ භාවිතයෙන් ඉවත්කර ඇති වාහන සඳහා ඉදිරිපත් කරන ඉහලම වටිනාකම, අදාල තක්සේරු අගයට වඩා අඩුවන්නේ නම් එම වාහන විකිණීම සිදු නොකරනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් වූ අවසාන තීරණය රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

## 06 සාර්ථක ලංසුකරු විසින් වාහන ඉවත්කර ගැනීම

6.1 ලංසු පිළිගත් බව සාර්ථක ලංසුකරුවන් වෙත දැන්වීමෙන් පසු කාර්යාල දින හතක් (07) ඇතුළත වාහන සඳහා ඔහු විසින් ඉදිරිපත් කර ඇති සම්පූර්ණ මුදල රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයේ සරප් අංශය වෙත මුදලින් ගෙවිය යුතුය. ලංසු පිළිගැනීමේ ලිපියෙහි සඳහන් කර ඇති දින ගණන ඇතුළත ලංසුකරුවන් විසින් සම්පූර්ණ මුදල් ගෙවා සියළුම වාහන ගාල් කර තිබෙන පරිශ්‍රයෙන් ඉවත් කරගත යුතු වේ.

6.2 නියමිත කාලය තුළදී, සාර්ථක ලංසුකරු විසින් අදාල වාහනය සඳහා සම්පූර්ණ මුදල ගෙවීමට අපොහොසත්වන අවස්ථාවකදී, අදාළ විකිණීමේ තීරණය අවලංගු කර, ආපසු ගෙවන ලංසු තැන්පතුව රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ඇත.

6.3 විකිණීමට නියමිත කිසියම් වාහනයක් තීරු බදු රහිතව හෝ විශේෂ තීරු බදු කොන්දේසි යටතේ ආනයනය කර ඇති අවස්ථාවක, අදාල වාහනය සඳහා තේරීපත් වන ලංසුකරු විසින් ශ්‍රී ලංකා රේගුව වෙත ගෙවිය යුතු මුදල සෘජුව ශ්‍රී ලංකා රේගුවට ගෙවීම් කර ලබාගන්නා කුවිතාන්සි පත ඉදිරිපත් කිරීමෙන් පසු සාර්ථක ලංසු වටිනාකමේ මුදල රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයේ සරප් අංශය වෙත ගෙවිය යුතුය.

6.4 නියමිත පරිදි මුදල් ගෙවා ඉවත්කර ගැනීමට අපොහොසත් වන වාහනයක්, ඒ සඳහා ඉදිරිපත් වී ඇති වැඩිම ලංසු අගය යටතේ මිලදී ගැනීමට අදාළ වාහනයට දෙවන වැඩිම ලංසු ඉදිරිපත් කළ ලංසුකරුට හිමිවේ. දෙවන ඉහල ලංසුකරු ඒ සඳහා එකඟ නොවන්නේ නම්, අදාළ වාහනය සඳහා නැවත මිල ගණන් කැඳවීම හෝ වෙනත් සුදුසු තීරණයක් ගැනීමේ බලය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

6.5 සම්පූර්ණ මුදල් ගෙවන ලද වාහන, සතියේ වැඩකරණ දින 07ක් ඇතුලත මුදල් ගෙවීමේ රිසිට්පත ඉදිරිපත් කර, කාර්යාල පරිශ්‍රයෙන් ඉවත්කරගත යුතු අතර, එසේ නියම කරන දිනයන්හිදී ඉවත්කර නොගන්නා වාහනවල ආරක්ෂාව සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය වගකියනු නොලැබේ.

CONFIDENTIAL

**07 ආපසු ගෙවනු ලබන ලංසු තැන්පත් නිදහස් කිරීම.**

7.1. සාර්ථක ලංසුකරුවකු වී මිලදී ගැනීම පැහැර හරින ලද ලංසුකරුවන් හැර සියලු ලංසුකරුවන් හට ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල ලංසු විවෘත කරන දින සිට මසක් ඇතුලත අදාළ ගෙවීම් කුවිතාන්සි වල මුල් පිටපත ඉදිරිපත් කිරීමෙන් ආපසු ලබාගත හැකිය.

CONFIDENTIAL